# නෑ, බෑ වැනි වචන මනුෂ්‍යයාට අයිති වචන නොවෙයි

**සාකච්ඡා කෙළේ තනූජා ධර්මපාල**

ඔබේ එදිනෙදා ජීවිතයේ ගැටලුවලට ධර්මානුකූල ව විසඳුම් සෙවීම ඔස්සේ ඔබගේ ම වීර්යයෙන් ඒවා විසඳා ගැනීමට මඟ පෙන්වීමක් කිරීම අපි දිගින් දිගට ම කරගෙන යමු. විවිධ භාවනා ක්‍රම ඔස්සේ මෙසේ විසඳුම් සොයන ඔබ ගේ මනස නිරායාසයෙන් ම දියුණු වේවි. ඔබ තුළ කිසියම් යහපත් යමක් වර්ධනය වෙමින් පවතින බව ඔබට වැටහේවි. මේ යහපත් මාර්ගයේ ගමන්ගන්නා ඔබට ජීවිතයේ දී මුහුණ පෑමට සිදුවන සුළු උවදුරුකාරී තත්ත්වවල දී ප්‍රයෝජනයට ගත හැකි 'බුද්ධ මන්තරයක්' වැනි ජයමංගල ගාථාහි අරුත් මේ ලිපියේ මුල දී ම ඉදිරිපත් කොට, දෙවැනු ව අපි අපේ මෙවර සාකච්ඡාව අරඹමු. මේ 'බුද්ධ මන්තරය' අරුත් වශයෙන් වටහා ගෙන ශ්‍රවණය කිරීමට හෝ ගායනා කිරීමට යොමුවීම ඉතා හොඳ බව බුදුරජාණන්වහන්සේ දේශනා කළා. ඔබ නිතර මේ ගාථා අසා තිබුණත් ඒවාහි අරුත් වටහාගෙන නැති ව ඇති:

1 වැනි ගාථාවේ අර්ථය:

දහසක් අත් සහ සැත් ද දරමින් ගිරිමේඛලා ඇතු පිට එන්නා වූ මාර සේනා දනාදි පාරමී බලෙන් අප මුනින්ද දිනූ සේක. ඒ තේජසින් ඔබට ජය මංගල්‍ය වේවා!

2 වැනි ගාථාවේ අර්ථය:

මුළු රෑ පුරාවට යුද වැදී එන්නා වූ මාර සේනා ද, දැඩි වූ අලවූ යකු නැගුවා වූ ඝොරතර නාදය ද දමනයෙන් ඉවසූ බලයෙන් අප මුනින්ද දිනූ සේක. ඒ තේජසින් ඔබට ජය මංගල්‍ය වේවා!



3 නාලාගිරි නම් ඇතා සුරාවෙන් මත් ව මහා හෙණ හඬ පතුරුවා දරුණු ලෙස ආ කල්හි සිහිල් වූ මෛත්‍රී බලයෙන් අප මුනින්ද දිනූ සේක. ඒ තේජසින් ඔබට ජය මංගල්‍ය වේවා!

4 අංගුලිමාල නම් සොරා කඩුවක් ද ඔසවා ගෙන දරුණු සිත් ඇති ව තුන් යොදුනක් දුර දිව ආ විට පෙන්වූ ඉර්ධි බලයෙන් අප මුනින්ද දිනූ සේක. ඒ තේජසින් ඔබට ජය මංගල්‍ය වේවා!

5 ගර්භනී වූ මවක සේ දරමිටිය බැඳ චිංචාව ජන මැද නින්දා කරන විට සංසුන් සමාහිත බලෙන් අප මුනින්ද දිනූ සේක. ඒ තේජසින් ඔබට ජය මංගල්‍ය වේවා!

6 සච්චක නමැත්තා සත්‍යය බැහැර කරමින් අඳබල් සිතින් ඔද වැඩී වාදයට එද්දී, ප්‍රඥා ප්‍රදීප දල්වා අප මුනින්ද දිනූ සේක. ඒ තේජසින් ඔබට ජය මංගල්‍ය වේවා!

7 ඉර්ධි බලෙන් යුත් ථේර නා රජුන්, නන්දෝපනන්ද නා රජු දමනය කෙළේ ය. ඒ ඉර්ධියට මඟ කියා අප මුනින්ද දිනූ සේක. ඒ තේජසින් ඔබට ජය මංගල්‍ය වේවා!

8 මිසදිටු මතින් මත් ව, නො දැමුණු සිතින් යුතු ව බඹ ලොවෙහි බක නම් බඹූ මානෙන් දැපී සිටිය දී සිය ඤාණය මෙහෙයවා අප මුනින්ද දිනූ සේක. ඒ තේජසින් ඔබට ජය මංගල්‍ය වේවා!

9 ගාථා අටකින් යුත් සම්බුදුන් ගේ ජය මඟුල් කවරකු හෝ බැති සිතින් සෑම දිනයක කියත් නම් තිබෙනා උවදුරු දුරු වී යන්නේ ය. නුවණැ'ති පින්වතා නිවන ද ලබන්නේ ය.

මේ ගාථාහි අරුත් වටහාගෙන ශ්‍රවණය කිරීම ඔබ ගේ මානසිකත්වය තවදුරටත් ශක්තිමත් වීමට හේතු වේවි.

මීළඟට අපි අපේ ප්‍රධාන මාතෘකාව වෙත යොමු වෙමු. ඔබ ඔබ ගේ දියුණුව ගැන තැවෙන්නෙක් ද? ඔබ පතනා තරමේ ලෞකික දියුණුවක් ඔබට තවමත් ලැබී නැති ද? එසේ නම් අද සාකච්ඡාව ඔබ වෙනුවෙනි.

ඒ අනුව මෙවර අප ගේ අවධානය යොමුවන්නේ සමෘද්ධිමත් වීමට අවශ්‍ය කරුණු පිළිබඳව යි. බෝධිරාජ කුමාර සූත්‍රයේ මේ පිළිබඳ සවිස්තරාත්මක සඳහනක් අපට දැකගත හැකි යි. කිසියම් විෂයයක් සාර්ථක ව අධ්‍යයනය කිරීමට සහ ඒ අනුව සමෘද්ධිය උදාකර ගැනීම සඳහා පුද්ගලයකු සතු විය යුතු කුසලතා පහක් ගැන එහි දැක්වෙනවා. යම්කිසි විෂයයක් හදාරා වෘත්තිය නිපුණත්වයට පත්වීමට ඔබ සිතන්නේ නම් මේ ගැන ඔබ ගේ අවධානය යොමු කිරීම වැදගත්.

මෙහි දී බෝධිරාජ කුමාරයා බුදුරජාණන්වහන්සේ හමුවට'විත් අසා සිටිනවා "භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ වෙත පැමිණ ධර්මමාර්ගයේ ගමන් ගන්නා පුද්ගලයින්ට ඒ මාර්ගය දියුණු කරන්නට කොපමණ කලක් ගත වෙනවා ද" කියා.

විට බුදුරජාණන්වහන්සේත් පෙරළා ඔහුගෙන් පැනයක් අසනවා: 'කුමාරය ඔබ හස්ති ශිල්පයේ කෙළ පැමිණියෙක්. හෙණ්ඩුවෙන් හස්තියා මෙල්ල කිරීමට අති දක්ෂයෙක්. එහෙත් ඔබ වෙත ඒ ශිල්පය හැදෑරීමේ අදහසින් පැමිණෙන පුද්ගලයකු කෙරෙහි ඔබ ගේ කුසලතා සහ මේ ශිල්පය ගැන ඔබ වෙත වන දැනුම පිළිබඳ අවබෝධයක් නැතිනම් ඒ පුද්ගලයාට හැකි ද ඔබගෙන් සාර්ථක ව ශිල්ප ලබාගැනීමට?

එවිට කුමාරයා පිළිතුරු දෙනවා එවිට ඒ පුද්ගලයාට ශිල්ප ඥානය ලබාගත නොහැකි වනවා යි කියා. එසේ නම් කිසියම් විෂයයක් හැදෑරීමට යොමුවන පුද්ගලයා කෙරෙහි තිබිය යුතු පළමුවැනි සුදුසුකම නම්, අදාළ ශිල්ප ඥානය ලබාදෙන තැනැත්තා කෙරෙහි ඇතිකරගත් පැහැදීම යි.




දෙවැනි කරුණ නම් ශිල්ප හදාරන්නා වෙත පැවැතිය යුතු නිරෝගී බව යි. රෝගී බවින් පෙළෙන්නකුට යම් ශිල්පයක් හැදෑරීමට ඒ රෝගය විශාල බාධාවක්. එහෙත් කිසි ම පුද්ගලයකු පූර්ණ ලෙස ම නිරෝගී නොවන බව බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කළා. අප පරිහරණය කරන කයෙහි ඇති නිස්සාරත්වය කොතෙක් ද යත්, එවැනි කයක් දරා හිඳිමින් පූර්ණ නිරෝගීභාවයක් ගැන කිසි ම විටෙක කිසිවකුට උදම් ඇනිය හැකි නො වේ. එම නිසා මෙහි දී සලකා බැලෙන්නේ පූර්ණ නිරෝගීභාවයක් ගැන නොව ලෙඩ අඩුවීම ගැන පමණි. එසේ නම් දෙවැනි කරුණ එය යි.

තුන්වැනි වැදගත් කරුණ නම් ඒ පුද්ගලයා ශිල්පීය ඥානය ලබාදෙන්නා වෙත සිය සැබෑ ස්වභාවය ප්‍රකට කරවී ම යි. ඔහු ෂට මායා නම්, එනම් කපටි මායාකාරි නම් ගුරුවරයාට ඔහු වෙත පවතින දුර්වලතා හඳුනාගත නොහැකි වේ. එවිට ඒවා මඟහරවා නිසි මඟ යොමුකරවීමේ අවස්ථාව ගුරුවරයාට උදා නො වේ.

මීළඟ කරුණ නම් අලස නැති බව යි. උත්සාහය යි. වීර්යය යි.

ඊළඟට වැදගත් වන්නේ ප්‍රඥාව යි.

මේ කරුණු පහ ඉදිරිපත් කිරීමෙන් පසු බුදුරජාණන්වහන්සේ බෝධිරාජ කුමාරයා ගෙන් මෙසේ විමසා හිටියා, 'කුමාරය, මේ කරුණු පහෙන් සමන්විත පුද්ගලයකු ඔබ වෙත පැමිණියේ නම්, ඔබට ඔබ ගේ හෙණ්ඩු ශිල්පය මැනැවින් ඔහුට ඉගැන්විය හැකි ද?'

එවිට කුමාරයා මේ කරුණු පහ අවිවාදයෙන් පිළිගෙන එවැන්නකුට ශිල්ප ඉගැන්වීම ඉතා පහසු බව කියා සිටියා. මේ ආකාරයට ම මේ කරුණු පහ එනම් බුදුරජාණන්වහන්සේ ගේ අවබෝධය පිළිබඳ ඇතිකරගත් පැහැදීම, ඕනෑ ම දෙයක් වළඳා දිවි රැකගත හැකි නම්, අව්වට වැස්සට පින්නට ඔරොත්තු දීමේ හැකියා ව ඇත්තකු නම් (ලෙඩ අඩු), සට කපට නැතිනම්, වීර්යවන්ත, (අකුසල් දුරු කිරීමේ සහ කුසල් වැඩීමේ වීර්යය යි) ප්‍රඥාවන්තයාට ඉතා සුළු කලකින් ධර්මය දැකගත හැකි බව එවිට අප තථාගතයන්වහන්සේ ඒ රාජ කුමාරයා ගේ පැනයට පිළිතුරු ලෙස දේශනා කොට වදාළා.

මෙන්න මේ විදියට උන්වහන්සේ මේ කරුණු පහ ලෝකෝත්තර විෂයයක් කෙරෙහි ගළපන්නට පෙර ලෞකික විෂයයක් කෙරෙහි ගළපා අපට පෙන්වා තිබෙනවා.

අපට ලෞකික ජීවිතය සාර්ථක කරගැනීමටත් මේ කරුණු අත්‍යවශ්‍යය යි. අපට විශ්වාසය තබා ගෙන පුහුණුවීමට මනා ශිල්පීය ඥානයෙන් යුතු පුද්ගලයන් අවශ්‍යය යි. හොඳින් සිතා බලන්න මේ කරුණු පහ මත ම නෙවෙයි ද කියා ලෝකය දියුණු වී ඇත්තේ. අපි හැමදාම පිටරටවලට ආවඩමින් දියුණු යැයි සම්මත ලෝකය දෙස බලමින් දුක්වෙමින් සිටිනවා. අපි දියුණු නෑ දියුණු නෑ කියමින් අපට ම අපි අපහාස කරගනිමිනුයි ඉන්නේ. අපි දියුණු නැත්නම් ඒ ඇයි? දියුණුව ඇති කර ගැනීමට අවශ්‍ය කරුණු අපි ඇතිකර නො ගැනීම ම යි මේකට හේතුව.

දැන් ලෝකයේ මෑතක දී දියුණු වූ රටවල් අරගෙන බලන්න. හිස් මුඩු බිම්වලට නෙවෙයි ද ඒ මිනිස්සු මුලින් ගියේ. ඒ මත නෙවෙයි ද ඒ අය යම්කිසි ලෞකික සමෘද්ධියක් ඉපැද්දෙව්වේ. අපි තව ම කරන්නේ අපේ අතීතය ගැන ම හොරණෑ පිඹ පිඹ හිඳීම පමණ යි. අපි වර්තමානයේ එවැනි හපන්කම් කිරීමට වීරියක් උපද්දවා තිබෙනවා ද? නෑ නේද? අපේ සමාජයට තිබෙන විශාල ප්‍රශ්නයක් තමා ශිල්පී ඥානයෙන් හෙබි පුද්ගලයන් ගේ නායකත්වයක් සමාජයට නොමැති වීම. එහෙමත් නැත්නම් එවන් ඥානයක් ඇති පුද්ගලයන් ගැන අනෙකුත් අය ගේ පැහැදීමක් නැතිකම. පැහැදීම තිබෙනවා නම්, එවන් ඥානයක් තිබෙන අය වටා රොක් වී, සහයෝගයෙන් පුහුණුවීම අරඹනවා නේ නේ ද?

දැන් අපේ ඈත ගම්මානවල මිනිස්සු මොන තරම් දිළිඳු ද? ලෞකික වශයෙන් නොදියුණු ඒ මිනිස්සු මානසික වශයෙනුත් හරි දුර්වල යි. ඊර්ෂ්‍යාව, කුඩුකේඩුකම, කොඩිවිණ කිරීම්, අන් අයට නින්දා අපහාස කිරීම් ආදියේ යෙදෙමින් මානසික ව බලවත් පිරිහීමකයි ඒ අය ඉන්නේ. මානසික ව පිරිහී ඉන්නා මේ පිරිස ලෞකික ව තමන් දියුණුවීමට යොමුවන්නේත් නෑ. ඒ සඳහා ක්‍රියා කරන අයට ඉඩ දෙන්නේත් නැති තත්ත්ව අපි දකිනවා.

ඒත් අපි අප තුළ පෙර සඳහන් කළ කරුණු පහ වර්ධනය කරගන්නේ නම් අපට මේ තත්ත්වය ජයගත හැකි යි. දැන් අපි ලෝකෙට ණය වී හිටියාට මේ රටේ එක යුගයක් තිබුණා පෙරදිග ධාන්‍යාගාරය ලෙස පැවති. ඒ කාලෙ මේ රටේ හිටියෙ රහතන්වහන්සේලා. කතා කළේ චතුරාර්ය සත්‍යයය. අනිත්‍ය භාවය වැනි සිතිවිලි මිනිසා ගේ සාමාන්‍ය ජීවිතය සමඟ බද්ධ වී තිබුණා. කර්ම විපාක ගැන මිනිස්සු හොඳ අවබෝධයකින් හිටියා. ඒ මිනිස්සු ඒ අයට ලැබුණු මනුෂ්‍ය ජීවිතයෙන් හැම අතින් ම හොඳ ප්‍රයෝජන ගත් අය. මිනිසා ගුණ ධර්මවලින් දියුණු මට්ටමක යි හිටියේ. පොළොව සරුසාර වුණා. කලට වැසි වැස්සා. පොළොවේ තිබුණු වටිනා වස්තු මතුවුණා. මේ සියලු දේ සිදුවුණේ මිනිසාගේ ගුණ වගාවත් වීර්යය, ඥානය ආදි සියලු දේත් එක්තැන් වූ නිසයි. දැන් අපට මේ සියලු යහපත් දේ අහිමි වී තිබෙන්නේ මේ යහ ගුණ සියල්ල අප අතරින් තුරන් වෙමින් පවතින නිසා. කිසියම්

හේතුවක් නිසා නම් ඵලයක් හටගන්නේ ඒ හේතුව නැත්නම් ඒ ඵලය නැති වී යනවා. ඒත් අපේ රටේ දැන් බලාපොරොත්තු වෙන්නේ හේතුව රහිත ඵලයක් උපද්දවන්න යි. කවදාවත් ඒක කරන්න පුළුවන් ද? බැහැ.

මා මෙතැන දී අදහස් කරන්නේ, මේ සමාජයට අයත් එක් එක් මනුෂ්‍යයා පෞද්ගලිකව තම ජීවිතය ගැන වටිනාකම හඳුනාගෙන තම තමන් පොදු සමාජයට කළ යුතු පොදු මෙහෙවරක් හඳුනාගෙන කරුණාව මෛත්‍රිය ඇති ව ආරම්භයක් ඇති කර ගත යුතු යි කියා යි.

ලෞකික හෝ වේවා, ලෝකෝත්තර හෝ වේවා යමක දියුණුවක් දැකිය හැක්කේ එවිට යි. නැත්නම් එක්කෙනෙක් නගින්න හදද්දි අනිත් අය ඔක්කොම හදන්නෙ නගින මනුස්සය පහළට අදින්න.

දැන් බලන්න ඒ පුරාණ සමාජයේ මොන තරම් සමබරතාවක් තිබිල තියෙනවද කියලා. දැන් මිනිස්සුන්ට අනිත්‍යතාව ගැන, අසුබය ගැන යමක් කීවොත් ඒක අහන්නත් බය යි. හැමෝම හිතන් ඉන්නේ හැමදේම නිත්‍යයි කියලා. එහෙම හිතාගෙන දුවන දිවිල්ලෙ ඉවරයක් තියෙනව ද? දුවන්නෙත් නිකං නෙවෙයිනෙ, වටාපිටාවෙ ඉන්න අය පාගගෙන. මේ දිවිල්ලෙ කෙළවර මොකක් ද? දුවල දුවල හැමෝම හති වැටිල නැද්ද? කායික ව මානසික ව රෝගී වෙලා නැද්ද?

දවසක් මට එක මනුස්සයෙක් කියනවා, මොන දේ කීවත් කමක් නෑ අසුබය ගැන නම් කියන්න එපාලු. මං ඇහුවා ඒ මොකද කියලා. එතකොට අහන අය කලකිරෙයිලු.

මං කිව්ව එහෙනම් ඉතිං මේ තරුණ ළමයි කාටවත් වෛද්‍ය විද්‍යාලෙ නම් යවන්න එපා කියලා. ඇයි ඉතිං මේ ශිෂ්‍යයන්ට වෙන්නෙම මළ මිනී එක්ක හැප්පෙන්නනෙ. මොන තරම් ජරාවක් දකිනවා ද? එහෙනම් ඒ හැමෝම කලකිරේවිනෙ නේද?

අනිත් එක තමා මං ඒ පුද්ගලයාට කිව්වා කාටවත් ම මළපහ කරන්න ඉඩ දෙන්න එපා කියලා. මොකද මේ ජරා ගොඩ ශරීරෙ ඇතුළෙ තිබුණනෙ කියලා මිනිස්සු කලකිරෙන්න පුළුවන්නෙ.

දවසක් දත් මදින්නෙ නැති ව, මූණ නොසෝදා ඉඳලා බලන්න අපේ ශරීරෙ සැබෑ තත්ත්වයට අපිටවත් මූණ දෙන්න පුළුවන් ද කියලා. අනික මනුස්සයෙකුට ටිකක් වැඩිපුර දඩිය දැම්මත් මේ විදියට පුළුවන්නෙ කලකිරෙන්න. මේ ශරීරෙ කිසි ම සුවඳවත් දෙයක් නැහැනේ. පස් බවට පත්වෙලා යන කෙස්, ලොම්, නිය, දත්, සම, ඇට, විවිධ අවයව වාගේ කොටස්, ලේ, සෙම, කඳුළු, මුත්‍ර වාගේ දිය වී යන කොටස්, ඉහළින් පහළින් පිටවන වාත කොටස්, ශරීරය මෝරා යෑමටත් හේතුවන උෂ්ණ කොටස් ආදියේ එකතුවක්නෙ මේ කය. ඒක එහෙම නෙවේ කියන්න මොන ජගතට ද පුළුවන්. මේවා ගැන සාමාන්‍ය ජනයා හොඳ අවබෝධයකින් යුතු ව හිටි යුගයක තමයි අපේ රට සමෘද්ධියේ ඉහළ ම තැනක තිබුණේ. මේ අවබෝධය නිසා ම නේද මිනිස්සු එකිනෙකාට වළ කපා ගැනීම නවත්තන්නේ. එකමුතු වෙන්නේ. සාමූහික ව දියුණු වෙන්නේ.

අනික තමා නෑ, බෑ වගේ වචන මනුෂ්‍යයාට අයිති වචන නෙවේ. අපි කියන්න ම පුරුදු වෙලා ඉන්නෙ මේ වචන නෙ. මනුෂ්‍යයාට සුදුසු වන්නේ යමක් 'කෙසේ ද අප කරන්නේ' යනුවෙන් කල්පනා කිරීම යි. මේ විදියට කල්පනා කළොත් විතරයි මනුෂ්‍යයන්ට මනුෂ්‍යයන් හැටියට දියුණු වෙන්න පුළුවන් වෙන්නෙ. අනික මනුෂ්‍යයන්ට බැරිනම් අභ්‍යන්තර වශයෙන් කිසි ම ගුණයක් දියුණු කරන්න මිනිසා සහ සතුන් අතර ලොකු වෙනසක් නැහැ. ඒ වගේ ම මනුෂ්‍යයන්ට වඩා සතුන් දියුණුයි. මොකද දන්නව ද? මිනිසුන් අතර තරම් කලකෝලාහල සතුන් අතර නැහැ. මිනිසුන් අතර තරම් අඩදබර, අර්බුද, ඊර්ෂ්‍යාව සතුන් අතර නැහැ. මේ අතින් මිනිසා සතුන්ට වඩා පිරිහිලා. ඒත් දියුණුවක් අත්දකින්නට ඒ සඳහා මනුෂ්‍යයන් වෙත තිබිය යුතු ගුණ ඔවුන් සතු ව තිබෙනවා. ඒත් අවාසනාවට මේ දේ තමා තුළ ම ඇති බව මිනිසා හඳුනාගෙන නැහැ. මේ ගුණ මනුෂ්‍යා උත්සාහයෙන් උපදවා ගෙන දියුණු කරගත යුතු යි.

දැන් බලන්න නොයෙකුත් ශිල්ප දත් බව උතුම් මංගල කරුණක් හැටියට මංගල සූත්‍රයේ දී අප භාග්‍යවතුන්වහන්සේ ප්‍රකාශ කර තිබෙනවා. ඒත් නිකම් ම ශිල්ප ඉගෙන ගෙන බැහැ. ඒ ශිල්පීය ඥානය විනයකින් හික්ම විය යුතු බව ද එහි ම ඊළඟ කාරණාව හැටියට සඳහන් ව තිබෙනවා. බලන්න එය මොන තරමට විස්මිත සඳහනක් ද කියා. අද ලෝකය ගමන් ගන්නා ආකාරය දෙස බලද්දී මේ කරුණ මොන තරම් වැදගත් ද? අද මනුෂ්‍යා වෙත පවතින ශිල්පඥානය විනයකින් හික්මෙනවා ද? එය එසේ නොමැති වන විට ඒ ඥානය මුළු මානව සංහතියට ම හානිදායක වන අයුරින් නෙවේ ද උපයෝගී කොට ගැනෙන්නේ? මිනිසා සතු ශිල්ප ඥානය නිසා ම අප විනාශය කරා යොමු වී නැත් ද?

අනෙක් අතට මේ මංගල සූත්‍රය දේශනා කිරීම පිණිස අප භාග්‍යවතුන්වහන්සේට ආරාධනා කොට සිටියේ පවා දෙවි කෙනෙක්. බොහෝ දෙවි මිනිසුන් උතුම් මංගල කරුණු ගැන දැන ගැනීමේ අභිලාෂ ඇති ව සිටිනා බව ඒ දෙවියා බුදුරජාණන්වහන්සේ අභිමුවෙහි පවසා සිටියා. ඒ අනුව යි මේ සූත්‍රය දේශනා කෙරුණේ.

අද අපි කතා කරනවා සන්නිවේදනයේ මහා දියුණුවක් ගැන. ඒත් එකල මනස දියුණු කිරීමෙන් දෙවියන් හා කතාබස් කිරීම සාමාන්‍ය දෙයක් බවට පත්ව තිබුණා. ඒ අතින් බලන විට විවිධ තාක්ෂණික උපකරණ පමණක් දියුණු කිරීමෙන් ලද හැකි සන්නිවේදන දියුණුව මොන තරම් සීමිත ද?

අප භාග්‍යවතුන්වහන්සේ ගේ විස්මිත අවබෝධයට හසු නොවූ විෂය ක්ෂේත්‍රයක් නැහැ. උන්වහන්සේ මේ අවබෝධය ලැබුවේ භෞතික උපකරණ ඔස්සේ ලොව දකින ක්‍රම අනුව නො වේ. උන්වහන්සේ ගේ විද්‍යාගාරය වූයේ භාවනාව යි. උපකරණය දියුණු කරන ලද ප්‍රඥාව යි. ඒ ප්‍රඥාලෝකය අති ප්‍රබල යි. හිරු කිරණ ලොව එක් පැත්තකට වැටෙනා විට අනෙක් පස අඳුරින් වැසී යයි. අප භාග්‍යවතුන්වහන්සේ ගේ ප්‍රඥාලෝකය හිරු එළිය පරදවා නැගී සිටින්නේ එබැවින්. එක් මොහොතකින් මේ ප්‍රඥාලෝකය ඕනෑ ම දිශාවක් ඔස්සේ යොමු කළ හැකි වුණා. ඒ අනුව ම සියල්ල පිරිසිඳ දත හැකි වුණා. උන්වහන්සේ සියල්ලන් හා සියල්ල ජය ගත්තේ එබැවින්.

සාමාන්‍යයෙන් ඕනෑ ම කෙනකුට කවර ආකාරයක හෝ අවබෝධයකට එළැඹීමට බාහිර සහයෝගයක් වුවමනා යි. තමා බාහිරින් ලබන සහයෝගය අනුව චින්තනය මෙහෙයවීම සිදු කෙරේ. එහෙත් අප භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි සිදුවූයේ මීට ප්‍රතිවිරුද්ධ කාරණාවකි. එය සැබැවින් ම විස්මිත සිදුවීමකි. එතරම් පුදුම සහගත සිදුවීමක් ලොව තවත් නැත. මවු කුසකින් ලොව බිහි ව මනුෂ්‍යයකු ලෙස හැදී වැඩුණු උන්වහන්සේ, තමන්වහන්සේ ගේ මිනිස් සිත බාහිර කිසිවකු ගේ උපකාරයකින් තොර ව තමන් ගේ බුද්ධිය පමණක් ම උපයෝගී කරගෙන උත්තරීතර තත්ත්වයට පත් කරවූයේ ය. ඒ අසිරිමත් අවබෝධයට එළැඹීමට හැකි වූයේ අප ගේ භාග්‍යවතුන්වහන්සේට ම පමණි. උන්වහන්සේ අවබෝධ කළ ශ්‍රී සද්ධර්මයෙහි කියැවෙන්නේ මිනිසුන් ගේ ජීවිත ගැන පමණක් නො වේ. සියලු දෙවිවරුන්, බ්‍රහ්මයින්, ප්‍රේතයින්, මාරයින්, තිරිසනුන් ආදි අනන්ත සත්ත්වයින් ගේ ඉරණම සකස් වී ඇති ආකාරය අතිශය විද්‍යාත්මක න්‍යායයන් ඔස්සේ එහි විස්තර වේ.

ටාජ් මහල්, පීසාහි ඇලවෙන කුළුණ හෝ චීන මහා ප්‍රාකාරය ආදිය පුදුම සහගත නිර්මාණ සේ බොහෝ අය සිතති. එහෙත් ඒවාහි ඇති පුදුමය කුමක් ද? මිනිසුන් වහලුන් ලෙස යොදාගනිමින් ඔවුන් ගේ කඳුළින් සහ දහඩියෙන් තෙත් වූ මෙවන් නිර්මාණ මෙලොව තවදුරටත් ගොඩනැගෙනු ඇත. ටාජ් මහල් නිර්මාණය කළ නිර්මාණකරුවා ගේ දෑස පවා, යළි මෙවැන්නක් නිර්මාණය කළ නොහැකි වන සේ අන්ධ කර දැමිණි. එහෙත් එය මෙලොව ඇති ප්‍රේමයේ සංකේතයලු.

සැබැවින් ම සිතා බලන්න, ඉතිං මේ කිසිවක කිසිදු පුදුමයක් තිබේ ද? සැබෑ ම විස්මිත කාරණාව නම්, ජීවිතාවබෝධය කරා සිය මනස මෙහෙයවීමයි. මිනිසා ලොව පුදුමසහගත දේ ලෙස නම් කර ඇති විවිධ ගොඩනැගිලි දෙස බලා සිටීමෙන් කවරකුට හෝ ලද හැකි ජීවිතාවබෝධයක් ඇත් ද?

සියල්ල කළ හැකි ශක්තිය ඇත්තේ ඔබ තුළ ම ය. සමෘද්ධිමත් වීමට නම් ඔබ ඒ ශක්තිය දැන හඳුනාගත යුතු ය. ඔබ තුළ වීර්යය පුබුදුවා ගත යුතු ම ය.

***ලබන සතියේ ඔබ වියෝ දුකින් පෙළෙනවා ද?***